# අසත්පුරුෂයා වැඳුම් පිදුම් නැමති මඩ ගොහොරුවෙහි ගිලෙයි

## පිණ්ඩෝලභාරද්වාජත්ථෙරගාථා ඇසුරින්

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, ඛුද්දක නිකාය, ථෙරගාථාපාළි - පිටු අංක 52 - 53)

මේ ජීවිතය වෙන ආකාරයකින් නොවෙයි. ආහාර සිතට ශාන්තිය ගෙන නොදෙයි. ශරීරය ආහාර හේතුවෙන් ම පවතියි. මෙසේ දැක ආහාර සෙවීමෙහි හැසිරෙමි.

මිනිසුන්ගෙන් ලැබෙන යම් වැඳුම් පිදුම් ඇත්ද එය මඩ ගොහොරුවක් යැයි පණ්ඩිතයෝ කියති. උදුරාලිය නොහැකි සියුම් උලක් යැයි කියති. සත්කාරය අසත්පුරුෂයාට අත්හැරීමට නොහැකි බැවිනි.